ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/SB/Circular(2022)/02 චක්‍රලේඛ අංකය: PS/SB/Circular/10/2022

2022 අගෝස්තු මස 15 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

<u>රාජ්‍ය වියදම් පාලනය කිරීම</u>

වර්තමානයෙහි රටෙහි පවත්නා ආර්ථික අර්බුදය හමුවේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් විසින් රාජ්‍ය වියදම් පාලනය කිරීම කෙරෙහි දැඩිව සැළකිලිමත් විය යුතු බැවින්, භාණ්ඩාගාරයේ ලේකම් විසින් "රාජ්‍ය වියදම් පාලනය කිරීම" යන මැයෙන් යුතුව නිකුත් කරන ලද 2022.04.26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බවට ගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව, ඉහත චක්‍රලේඛ විධිවිධාන තරයේ අනුගමනය කිරීමට කටයුතු කරන ලෙසට මෙයින් දැනුම් දෙන අතර, එයට පරිබාහිරව සිදු කරනු ලබන රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් පෞද්ගලිකව වගකීමට බැඳී සිටින බව අවධාරණය කරමි.

ඊ.එම්.එස්.බී. ඒකනායක
ජනාධිපති ලේකම්

පිටපත්:

1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. භාණ්ඩාගාරයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව